# මලිති හරි හොඳ ළමයෙක්



විමුදි ඉමෙත්මා සේනාරත්න

# මලිති හරි හොඳ ළමයෙක්


## විමුදි ඉමෙත්මා සේනාරත්න

කතෘ


පළමු දිගහැරීම

**පාසල: මහමායා බාලිකා විදුහල. මහනුවර**

**ඉගෙනුම ලබන පංතිය: 2A**

**කෘතිය පළ කරන දිනය: 2025/02/09**


**ISBN: IS38568**

# පිදුම

**මාගේ දයාබර**

**මහමායා මැණියන්ට**

**හද බැතින්**

**පුද කරමි!**

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි.ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණිය යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝදමත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායාඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි.දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුලින් විස්කම් පෑම එයට හේතුවයි.පාසන තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවමෙඉට සම්බණ්ද කර ගැනීමට අප ගත් කතුවරියන් සමත් වීම සිවිශේෂ සිදුවීමකි.ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යලි ගොඩනගන්නට පිරිවෙන් ශෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන "හෙරණ ගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නටනායකත්ව දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මාහට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි.

ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමායා බාලිකා විදුහල . මහනුවර

මලිති හරි හොඳ ළමයෙක්.

අම්මයි තාත්තයි කියන දේ හොඳට අහන ,කවුරුත් ආදරේ කරන ලස්සන දරුවෙක්.



දවසක් මලිනිට පොඩි හෙම්බිරිස්සාවක් හැදුනා.

අම්මා මලිනිව දොස්තර ළඟට එක්කගෙන ගියා.



දොස්තර බෙහෙත් දීලා දවස් දෙක තුනක් නාන්නේ නැතුව ඉන්න කියලත් කිව්වා.

සීතල ජාති කන්න එපා කියලත් කිව්වා



මලිනි අම්මත් එක්ක ගෙදර
එනකොට අම්මත් මලිනිට
කිව්වා සීතල ජාති එහෙම
කන්න එපා පුතේ කියල.



පහුවදා මලිතිලාගේ නෑදෑ ගෙදරක දානයක්.

මලිති අත්තම්මත් එක්ක දානේ ගෙදර ගියා.



රස කෑම ගොඩාක් තිබුනා.
අයිස් ක්‍රීම් එහෙමත් තිබුනා.
මලිතිට අම්ම කියපු දේ මතක් උනා.



එත් අයිස් ක්‍රීම් කන්න හරිම ආසයි.

කාටත් හොරෙන් අයිස් ක්‍රීම් හොඳට කෑවා.



එදා රෑ මලිනිට හෙම්බිරිස්සාව හොඳටම වැඩි.

හුස්ම ගන්නත් අමාරු උනා.

ඔලුවත් රිදෙන්න ගත්තා.



පහුවදා උදේ හොදටම ඇඟට අමාරු නිසා ඉස්කෝලේ යන්නත් බැරි උනා.

මලිනිට හරිම දුකයි.




වෙනදා වගේම අම්මා කියපු දේ අහුවනම් මෙහෙම වෙන්න නෑනේ .

මලිතිට හිතුණා.



# පසුවදන



රටේ අනාගත් සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාතමක දියුණුවත් සාහිතය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත් පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැඟීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිථ්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි.එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.

පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත් , ජාතික හා ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්ම කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.මෙවර ඒ සඳහා පිරිවෙන් ශෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි.මෙහිදී මහමාය බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය දියණියන් ගුරු භවතුන් දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැපකිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුයි.මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි.පොතකින් දරුවෙකුට ලැබෙන ආශවාදය අන් කිසිවකින් වත් ලබාදිය නොහැකිය.මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විධ්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු , ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙවි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එකව විද්‍යුත් කෘති රචනා කරයි.තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහමායා බාලිකාවන් ඩිගිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ.තම නිසඟ සාහිත්‍ය නිර්මාණහැකියාව තුලින් එයට පිවිසි පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහලේකම්

ISBN: IS38568